**හානි පූර්ණය සඳහා වන කාර්යාලය - 2021**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1. මතය**

**--------**

හානි පූර්ණය සඳහා වන කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2. මතය සඳහා පදනම**

**------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැතේම් පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**-----------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| **(i.)** මුදල් රෙගුලාසි 715 (3) | ගබඩා භාරකරුවන් ගබඩා ද්‍රව්‍ය භාර ගැනීමට බලය දෙන ගබඩා නිලධාරීන්, ගබඩාවෙහි ගබඩා ද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා ප්‍රමාණවත් තරම් සහ සතුටුදායක ඉඩකඩ ඇති බවටත් සෑහීමට පත් විය යුතුය. නමුත් ආයතනයේ තොග ආරක්ෂිතව ගබඩා කර තැබීමට විධිමත් ස්ථානයක් නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | ගබඩාවේ භාණ්ඩ විධිමත්ව හා ආරක්ෂිත ලෙස ඉදිරියට පවත්වාගෙන යාමට සියලු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ගබඩා භාරකරුවන් ගබඩා ද්‍රව්‍ය භාර ගැනීමට බලය දෙන ගබඩා නිලධාරීන්, ගබඩාවෙහි ගබඩා ද්‍රව්‍ය තැන්පත් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 715(3) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii.) මුදල් රෙගුලාසි 751 (5) | දිරාපත්වීමෙන් හා අපතේ යාමෙන් හානි සිදුවීම වැළැක්වීමට පියවර ගනිමින් භාණ්ඩවල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතු වුවත් ඊට අනුගත නොවී කටයුතු කිරීම නිසා වටිනාකම රු.138,600 ක භාණ්ඩ අයිතම භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව ඇති බව නිරීක්ෂණය විය. | ආයතනයේ අභ්‍යන්තරව පත් කරන ලද විධිමත් කමිටුවක් මඟින් මෙම අයිතම නිසි පරිදි හඳුනා ගෙන විනාශ කිරීමට හෝ සුන්බුන් අගයන් ලෙස විකුණා යම් මුදලක් ලබා ගැනීමට හැකි නම් එකී කටයුතු අනුගමනය කරමින් විධිමත් පරිදි භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 751(5) ප්‍රකාරව දිරාපත්වීමෙන් හා අපතේ යාමෙන් හානි සිදුවීම වැළැක්වීමට පියවර ගනිමින් භාණ්ඩවල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii.) | මුදල් රෙගුලාසි 770(4) | ආයතනය සතු ත්‍රී රෝද රථය මුහුදු සුළං වැදීම හේතුවෙන් දිරාපත් වී ඇති අතර වසර 02 ක කාලයක සිට ධාවනය නොකර තිබෙන බව නිරීක්ෂණය විය. | තවදුරටත් අළුත්වැඩියා කිරීම ආර්ථිකමය ලෙස ඵලදායිදැයි යන්න විශ්ලේෂණය කොට එසේ කිරීම ඵලදායි නොවන්නේ නම් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත අපහරණය කිරීම සඳහා කටයුතු කිරීමට වගබලා ගනිමි. | අපහරණය කළ යුතු පාවිච්චි කළ නොහැකි වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 770(4) ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ආ) | අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ | | | |
| (i.) | 1 ඡේදය | කාර්යසාධන ගිවිසුම් අනුව ආයතනයේ සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ආයතනයේ මණ්ඩලික නිලධාරීන් සඳහා මෙම ක්‍රමවේදය භාවිතා වන අතර ආයතනයේ සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කොට මෙම ක්‍රමවේදය පවත්වා ගෙන යාමට බලාපොරොත්තු වෙමි. | අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1 ඡේදය අනුව ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතුය. |
| (ii.) | 4 ඡේදය | රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර වී පවත්නා මානව සම්පත රටේ සංවර්ධනය සඳහා වඩාත් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස යොදාගැනීම පිණිස රාජ්‍ය අංශය සතු මානව සම්පත සැලසුම්සහගතව සංවර්ධනය කිරීම අනිවාර්යය අවශ්‍යතාවයකි. ආයතනයේ කාර්යමණ්ඩලයේ සියලු දෙනාටම පවත්නා හා පැවැත්විය යුතු නිපුණතා අතර පරතරය පියවීම සඳහා සකස් කළ යුතු මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබුණි. | **නිරීක්ෂණය නිවැරදිය.** ඉදිරියේදී මානව සම්පත් සැලැස්ම සකස් කොට විගණනයට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි. | අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව ආයතනය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.17,114,511 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.16,593,948 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.33,708,459 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාත්මක කිරීමේ වියදම්, වන්දි ගෙවීම සඳහා වූ වෙනත් වියදම්, සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සඳහා වියදම, ක්‍රමක්ෂය වියදම සහ ස්ථාවර වත්කම් නඩත්තු වියදම්හී ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) හානි පූර්ණය සඳහා වන කාර්යාලය 2018 අංක 34 දරන හානි පූර්ණය සඳහා වන කාර්යාල පනත අනුව මූල්‍යමය වන්දි ප්‍රදානයන්ගෙන් ඔබ්බට ගොස් පීඩාවට පත් තැනැත්තන් හට ක්ෂේත්‍ර 07 ක් යටතේ හානි පූර්ණයන් ප්‍රදානය කරනු ලැබිය යුතු වුවත් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එසේ වන්දි හා මූල්‍යමය සහන හැර අනෙකුත් ප්‍රදානයන් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | හානිපූරණ කාර්යාලය සඳහා වන ප්‍රතිපත්ති සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත්තේ 2021 අගෝස්තු මස වන හෙයින් වර්ෂයේ මුල් මාස 8 ක කාල පරිච්ඡේදය තුලම අදාල වන්දි ගෙවීම් හැර සෙසු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය.<br><br>කෙසේ නමුත්, අදාල හානිපූරණ ප්‍රතිපත්ති ඔස්සේ අගතියට පත් පාර්ශවයන් වෙත සහන සැලසීම සඳහා නියමු ව්‍යාපෘති හා අනෙකුත් ක්ෂේත්‍ර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට ඇත. | 2018 අංක 34 දරන හානි පූර්ණය සඳහා වන කාර්යාල පනතට අනුව මූල්‍යමය වන්දි ප්‍රදානයන්ගෙන් ඔබ්බට ගොස් අනෙකුත් ප්‍රදානයන් ලබා දීමට ද කටයුතු කළ යුතුය. |
| (ආ) හානි පූර්ණය සඳහා වන කාර්යාලයේ වන්දි ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ පරිදි වන්දි යෝජනා ක්‍රම 03 ක් යටතේ ආයතනය වෙත මෙතෙක් යොමුකර ඇති වන්දි අයදුම්පත් 11,926 ක් සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් වන්දි මුදල් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආයතනය වෙත ලැබී ඇති 12,325ක අයදුම්පත් ප්‍රමාණයෙන් 2022 වර්ෂයේ මුල් කාර්තුව තුළ ලිපිගොනු 399ක් සඳහා රු.මිලියන 123ක් ගෙවීම් කොට ඇත. තවදුරටත් මහ භාණ්ඩාගාරය වෙතින් ලැබෙන අක් මුදල් යොදා ගනිමින් අදාළ වන්දි මුදල් ගෙවීම කඩිනම් කිරීමට කටයුතු කරමි. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව සකස් කර නියමිත වේලාවට ප්‍රතිපාදන ලබා ගෙන වන්දි ගෙවීම් සිදු කල යුතුය. |
| (ඇ) ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණය ලබා දීම සඳහා මූල්‍ය ආයතන 04ක රු.මිලියන 504.91ක මුදල් ආයෝජනය කර තිබූ අතර, ඉන් රු.මිලියන 16ක් කර්මාන්ත හා පුනරුත්ථාපන ණය සඳහා ලංකා බැංකුවේ ආයෝජනය කර තිබුණද, වසර 08ක කාලයක සිට මෙම මුදල උපයෝජනය කර නොතිබුණි. තවද, හානි පූර්ණය සඳහා වන කාර්යාලය විසින් ඉතිරි ණය යෝජනා ක්‍රම 03 යටතේ ණය ලබා දීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති ප්‍රතිලාභීන් නිර්දේශ කර බැංකුවට ඉදිරිපත් කරනු ලැබුවද බැංකුව විසින් ණය ලබා දී ඇති ප්‍රමාණය අවම මට්ටමේ පැවතුණි. | මෙම කර්මාන්ත පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රමයෙහි ඉලක්ක ගත කණ්ඩායම, විපතට පත් වුවන් වන අතර එකී පුද්ගලයන්ගේ විපතට පත් කර්මාන්ත පුනරුත්ථාපනය කිරීම අරමුණ විය. අදාළ මුදල උපයෝජනය කිරීමට අයදුම්පත් කිසිවක් විධිමත් පරිදි ලැබී නොමැති අතර ණය මුදල කල් පිරීමට නියමිත 2023.08.14 දිනට එය ලද වහාම භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉලක්ක ගත කණ්ඩායම් වල පුද්ගලයින්ගේ විපතට පත් කර්මාන්ත පුනරුත්ථාපනය කිරීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමයන්හී මුදල් යොදා ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් විගණිත දිනය වන විට ආයතනයේ කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 23 ක් පැවතුණි. | කැබිනට් මණ්ඩල තීරණ හා අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි මෙම බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීමට සිදු විය. කෙසේ නමුත් ආයතනයේ දැනට පවතින අවශ්‍යතාවය මත බඳවා ගැනීම් සිදු කිරීම සඳහා 2022.03.04 දිනැතිව අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලිඛිතවද අනුමැතිය ඉල්ලා සිටින ලදී. එම ඉල්ලීමට ප්‍රතිචාරයක් ලෙස 2022.04.02 දිනැතිව අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, හානි පූර්ණ නිලධාරී යන තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අදාළ බඳවා ගැනීම් සිදු කිරීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා කාලීන සමාලෝචනයක් සිදු කර ඒ අනුව අවශ්‍ය කටයුතු කළ යුතුය. |